# සන්නස

Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
7, Stuart Place
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## ඒ යුද්ධය කාගේ ද?

විවිධ කාල වකවානුවල දී ලෝකය තුළ විවිධාකාර වූ යුද්ධ සහ අරගල ඇතිවී ඇත. ඒවායේ මුහුණුවර විවිධාකාර ය. විටෙක එය දේශප්‍රේමී අරගලයකි. තවත් විටෙක ආගමික ය. ත්‍රස්තවාදී ය. ආක්‍රමණික අරගල ය. මේ කවරාකාර මුහුණුවරකින් කළඑළියට ආවද ඒ සියල්ල යුද්ධ ය. නූතනයේදී නම් මේ යුද්ධ හඳුන්වන්නේ මානුෂික මෙහෙයුම් ලෙස ය.

ශ්‍රී ලංකාවේ අපිද මෙවැනි බිහිසුණු දීර්ඝකාලීන යුද්ධයක අත්දැකීම් විඳ ඇත්තෙමු. ඒ යුද්ධයට මුල්ම හේතුව වූයේ ජාතියක් ලෙස තමන් නොසළකා හැර ඇතිය යන උතුරු නැගෙනහිර දෙමළ ජනයා තුළ ඇතිවී තිබූ හැඟීමත් ඊට පිළියම් ලබා ගැනීම සඳහා නිදහසින් පසු බිහිවූ ආණ්ඩු හරහා දැරූ උත්සාහයන් අසාර්ථක වීමෙන් ඇති වූ අපේක්ෂාභංගත්වය ආයුධ සන්නද්ධ අරගලයක් දක්වා පැතිර යාමත් ය. ඒ නිසාම ඒ යුද්ධය දෙමළ ජනතාවට විමුක්ති අරගලයක් ලෙසින්ද සිංහල ජනතාවට ත්‍රස්තවාදී අරගලයක් ලෙසින්ද පෙනී යාම පුදුමයක් නොවේ. එහෙත් ඒ යුද්ධයේ පීඩාව නම් වර්ග බේධයකින් තොරව සමස්ථ ජනතාවටම විඳ ගන්නට සිදුවිය. ඒ බිහිසුණු අත්දැකීමෙන් මිදෙන්නට කිසිදු ජනවර්ගයකට ඉඩක් නොවී ය.

දශක තුනකට වැඩි කාලයක් ඇදී ගිය මේ යුද්ධයෙන් දහස් ගණනකගේ ජීවිත අහිමිවූ අතර අංගවිකල වූවන් ගණනද දහස් ගණනකි. විවිධ වකවානු තුළ මේ යුද්ධයට නායකත්වය සැපයූවන් මෙන්ම ඒ සඳහා දායකත්වය ලබා දුන් පිරිස ද දහස් ගණනකි.

විටෙක ඉදිරියටද තවත් විටෙක පසුපසටද ජයග්‍රහණ හා පරාජ ලබමින් ඇදී ගිය මේ විනාශකාරී යුද්ධය අවසන් වීම සෑම ජන කොටසකගේම පොදු ප්‍රාර්ථනාව විය. ඒ ප්‍රාර්ථනාව ඉටු වූයේ මෙයට වසර තුනකට පෙර 2009 මැයි මාසයේදී ය. එය සැබෑ ලෙසම සාමාන්‍ය සෙබලාගේ සිට සේනානායකයා දක්වාද සාමාන්‍ය ජනතාවගේ සිට රටේ ඉහළම දේශපාලන නායකයා දක්වා වූ සෑම බහුජනකොටසකගේම පොදු ජයග්‍රහණයක් විය. **මේ සඳහා දායකත්වය සැපයීම විවිධ මට්ටම් වලදී විවිධාකාරයෙන් වුව ද ජයග්‍රහණය කරා යාමට ඒ සියලු දායකත්වයන් විවිධාකාරයෙන් ඉවහල් වූ බව අවිවාදිත ය.**

මේ සා කැප කිරීමක් කර ලබා ගත් මේ දැවැන්ත ජයග්‍රහණය තනි පුද්ගලයකුගේ ගිණුමකට බැර කිරීම කිසි ලෙසකින්වත් අනුමත කළ හැක්කක් නොවේ. පසුගිය දා අපට අසන්නට ලැබුණේ එවන් අමිහිරි අප්‍රසන්න කතන්දරයකි. රටේ නායකයාටත් සේනානායකයාටත් යුද්ධයේ විශේෂ වගකීමක් හා අයිතියක් ඇති නමුත් ඊට පහළ රජයේ සේවකයකුට මේ යුද්ධ ජයග්‍රහණය තමන්ගේ අයිතියක් ලෙස බෞතීස්ම කරවා ගැනීමට ඉඩ දීම ඒ ජයග්‍රහණය වෙනුවෙන් ජීවිත කැප කළ දහස් ගණනක් වූ මිනිසුනට කරන නිග්‍රහයකි.

ජයග්‍රහණයට පියවරුන් දහස් ගණනක් ඇති මුත් පරාජය අවජාතක ය.

**සංස්කාකරක - සන්නස**





# ආණ්ඩුව ශක්තිමත් ද?

## විපක්ෂය කල් මරමින් සිටින්නේ ද

බොහෝ අය සිතා සිටින්නේ මහින්ද රාජපක්ෂ රජය කිසි ලෙසකින්වත් සෙලවිය නොහැකි තරමේ ශක්තිමත් රජයක් වන බවයි. මේ වන විටත් ආණ්ඩු පක්ෂයේ අභ්‍යන්තරයේ ඇතිව තිබෙන අර්බුදය ගැන කිසිවක් නොදන්නා උදවිය සිතා සිටින්නේ තව අවුරුදු සියයකටවත් මේ රජය පෙරළා දමන්නට බැරි බවයි. නමුත් ඇත්ත වශයෙන්ම මේ වන විටත් ආණ්ඩු පක්ෂ තුල ඇත්තේ පාවාදීම්, ගේම් ගැසීම්, කොමිස් ගැනීම,පළි ගැනීම්, හිතවතුන් සතුටු කිරීම් වැනි දෑ පමණි. ආණ්ඩුපක්ෂයේ සිටින කිසිවකුට කිසිවකුත් විස්වාස නැති අතර මෙහි ඇත් එකම ධර්මය වන්නේ අවිස්වාසය පමණි.

වාර්තා වන තොරතුරු අනුව විපක්ෂයට මේ ආණ්ඩුව අවශ්‍ය නම් හෙට උදේ ගෙදර යවන්නට පුලුවන. ඒ සදහා ආණ්ඩු පක්ෂයෙන් හැට හැත්තෑවක් යළි විපක්ෂයට එන්නට සූදානම්ය. ඒ අනුව පවතින රජය පෙරළා දමා අලුතින් රජයක් පිහිටුවන්නට විපක්ෂයට හොදටම අවස්ථාවක් තිබුනත් එහිදී සිදු වන්නේ යළි 2002 දී සිදු වූ දෙයම විනා අන්යමක් නොවේ. විපක්ෂය විසින් පවතින ආණ්ඩුව ගෙදර යවා නව ආණ්ඩුවක් පිහිටුවනු ලැබිවද එය පිහිටා වසරකට පමණ පසු යළි මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට එය විසුරුවා හැරිය හැකි බැවින් යළි සිදු වන්නට නියමිත වන්නේ 2002 දී සිදු වූ විකට නාටකයම විනා වෙනත් යමක් නොවේ. මේ වන විටත් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් පණ දෙන්නට වුවත් සූදානමින් සිටින ඇතැම් හොද ළමයි තමන්ගේ පැවැත්මට ඕනෑම ගුරුවරයෙකු යටතේ ඉගෙන ගන්නට සූදානම්ය. ඒ නිසා මේ ආණ්ඩුව ගෙදර යැවීම මහින්ද අඹිසෙුන්දර කියන ආකාරයෙන් මහා කජ්ජක් නම් නොවේ.

මේ වන විට අපට ලැබෙන ආරංචි මාර්ග සනාත කරන්නේ විපක්ෂය මේ ආණ්ඩුවට මේ ගමන යන්නට ඉඩ දී බලා සිටින්නේ දැනුවත් භාවයෙනි. විපක්ෂය මේ කරමින් ඉන්නේ ආණ්ඩු පක්ෂය තුල ඉන්න උදවියට කුණු වෙන්නට ඉඩ දී බලා සිටීමය. මියගොස් සිටින ආණ්ඩු පක්ෂය එම්බාම් කරන්නට විපක්ෂය කොන්ත්‍රාත් ගැනීමෙන් සිදු වන්නේ ආණ්ඩු පක්ෂයේ දුර්ගන්දය ජනතාවට වසන් කිරීම පමණි. මේ නිසා එම්බාම් නොකර තබා ගැනීමෙන් මළ

4 වන පිටට